පක්ෂවත් භාර සේවා වියදම්					
දිනය	විස්තරය	වවුචර් අංකය	දිනය	විස්තරය	වවුචර් අංකය
2025	ආදායම් වියදම් ගිණුම්	125,990.02	2025	ලැබීම් ගෙවීම් ගිණුම්	125,990.02
		125,990.02			125,990.02

සමුච්චිත අරමුදල - 2025					
දිනය	විස්තරය	වවුචර් අංකය	දිනය	විස්තරය	වවුචර් අංකය
2025	උපචිතය	40,926.99	2025.01.01	ඉ/ගෙ ශේෂය	6,998,056.00
		6,957,129.01			
		6,998,056.00			6,998,056.00

සිරකරු සුබසාධක අරමුදල් අවසන් කිරීම - **2025**

2025.12.31 දිනට උපචිත ආදායම් කාල විශ්ලේෂණය

ආදායම් ශීර්ෂය	ආයතනය	කාල විශ්ලේෂණය (වර්ෂ)				එකතුව රු.
		01ට අඩු	02ට අඩු	2-5 අතර	5ට වැඩි	
සිරකරුවන්ගේ වේතනවලින් කරනු ලබන අනිවාර්ය අයකිරීම්	බෝගම්බර	-	32.10	-	-	32.10
එකතුව		-	32.10	-	-	32.10

සිරකරු සුබසාධක අරමුදල

2025.12.31 න් අවසන් වර්ෂය සඳහා අයවැයගත සංඛ්‍යා හා සත්‍ය සංඛ්‍යා අතර විචල්‍යතා ප්‍රකාශය

ලැබීම්/ ගෙවීම් ශීර්ෂය	අයවැයගත සංඛ්‍යා (රු)	සත්‍ය සංඛ්‍යා (රු.)	අයවැයගත සංඛ්‍යා හා සත්‍ය අතර විචල්‍යතා (රු.)
ලැබීම් ශීර්ෂ			
01. වෙළඳසැල්වලින් ලද දායක මුදල්	6,000.00	3,041.47	2,958.53
02. ප්‍රදර්ශනවලින් ලද දායක මුදල්	14,000.00	-	14,000.00
03. භෝජනාගාරවලින් ලද දායක මුදල්	-	-	-
04. සිර වෙතනවලින් කරනු ලබන අනිවාර්ය අඩුකිරීම්	502,000.00	1,503,880.19	(1,001,880.19)
05. සිර ශ්‍රමය සැපයීමෙන් වෙනත් දෙපාර්තමේන්තු හා ආයතනවලින් අය කරන මුදල්	140,000.00	148,124.00	(8,124.00)
06. හිමිකම් පා නොමැති මුදල්	22,400.00	-	22,400.00
07. බන්ධනාගාර භූමිය තුළ තිබී හමුවන අයිතිකරුවකු නැති බව ඔප්පුවූ මුදල්	3,700.00	150,970.00	(147,270.00)
08. වෙනත් දායක මුදල්	2,000.00	120,505.77	(118,505.77)
09. නීති විරෝධී ලෙස සිරකරුවන් වෙත තිබී හසුවූ මුදල්	40,300.00	10,470.00	29,830.00
10. විනෝද භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ශුද්ධ ආදායමෙන් 1/6 ක කොටස	55,400.00	-	55,400.00
11. ආපසු අයකර ගත යුතු අත්තිකාරම්	-	-	-
12. සිරකරු සුබසාධනය වෙනුවෙන් මහජනයා විසින් කරනු ලබන පරිත්‍යාග	114,000.00	-	114,000.00
	899,800.00	1,936,991.43	(1,037,191.43)
ගෙවීම් ශීර්ෂ			
01. සිරකරු ආධ්‍යාත්මික හා ආගමික වියදම්	558,000.00	578,921.00	(20,921.00)
02. සිරකරුවන්ගේ අධ්‍යාපනික හා සුබසාධක වියදම්	664,000.00	600,843.00	63,157.00
03. සිරකරුවන්ගේ ක්‍රීඩා හා වෙනත් පහසුකම් සැපයීමේ වියදම්	484,000.00	432,180.40	51,819.60
04. සිරකරුවන්ට තෑගි දීමේ වියදම්	254,000.00	232,524.00	21,476.00
05. පශ්චාත් භාර සේවා වියදම්	40,000.00	125,990.02	(85,990.02)
	2,000,000.00	1,970,458.42	29,541.58

Annual Deposit Accounts Summary for the Month of December 2025

To
Department of Prisons (232)
From
Director General, ,
Department of State Accounts, ,
General Treasury, Colombo1. .

Printed By **Alahakoon**
New Table No :**SA-31**
Old Table No :BTBL 72
Report Date 2/25/2026 7:25:06 PM

NEW CIGAS FINAL 2025 REPORTS

Head	Code	Opn_Bal	DR	CR	Clsn_Balance
232	6000-0-0-001-0-013-0	0.00	0.00	0.00	0.00
232	6000-0-0-001-0-016-0	6,331,044.94	7,448,434.75	9,637,031.29	8,519,641.48
232	6000-0-0-002-0-014-0	0.00	0.00	0.00	0.00
232	6000-0-0-002-0-017-0	16,246,827.95	23,487,990.00	27,536,890.98	20,295,728.93
232	6000-0-0-006-0-028-0	6,727,955.77	4,049,386.16	3,886,715.53	6,565,285.14
232	6000-0-0-006-0-081-0	5,505,356.37	10,322,802.08	10,358,321.01	5,540,875.30
232	6000-0-0-008-0-001-0	13,860,072.59	69,736.00	69,736.00	13,860,072.59
232	6000-0-0-011-0-618-0	0.00	0.00	484,980,000.00	484,980,000.00
232	6000-0-0-013-0-125-0	9,782,262.43	12,806,766.65	15,974,553.01	12,950,048.79
232	6000-0-0-016-0-062-0	61,511,121.31	6,579,218.24	21,638,681.67	76,570,584.74
232	6000-0-0-018-0-075-0	1,258,734.48	4,121,645.03	3,769,181.06	906,270.51

This is a computer-generated document. No signature is required.
Report Generated by the new CIGAS Web Application--Developed by Department of State Accounts, Ministry of Finance Planing and Economic Developme

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන (පවතී නම්) උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		නත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	2,000,000.00	-	1,785,483.42	98.52%
ප්‍රාග්ධන		-	184,975.00	

3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය - පරිත්‍යාග වශයෙන් මුදල් ලැබී නොමැත.

පරිත්‍යාගය කල ආයතනය	පරිත්‍යාගයේ අරමුණ	පරිත්‍යාග මුදල
-	-	-

3.4 විගණකාධිපතිවරයාගේ වාර්තාව

** පාර්ලිමේන්තුවට ඉදිරිපත්කිරීමේදී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය(SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒඑල්ඛ/ඔ/බි/ඩිරිපි/පෘඩි/2025 මඟේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2026 මැයි 15 දින

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
සිරකරු සුභසාධක අරමුදල

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **නත්ත්වාගණනය කළ මතය**

බන්ධනාගාර සිරකරු සුභසාධක අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ කොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තරකර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම් ප්‍රතිපත්ති අනුව අරමුදලේ ජංගම නොවන වත්කම් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන මගින් වාර්තා කිරීමට කටයුතුකළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ දී අරමුදලට පරිත්‍යාග වශයෙන් ලැබුණු රු.3,740,297ක් වටිනා ජංගම නොවන වත්කම් සමාලෝචිත වර්ෂයේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්කර නොතිබුණි.

(ආ) අරමුදල වෙනුවෙන් බන්ධනාගාර ආයතන වෙත පරිත්‍යාග වශයෙන් ලැබෙන පාරිභෝගික ද්‍රව්‍ය ගිණුම්ගත කිරීමට විධිමත් ප්‍රතිපත්තියක් හෝ හෙළිදරව් කිරීමක් හෝ කර නොතිබීම හේතුවෙන් රු.2,033,528ක පාරිභෝගික ද්‍රව්‍ය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් නැඹීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මුල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීමවලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මුල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මුල්‍ය ප්‍රකාශනවල සම්ස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මුල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2(අ) සහ (ආ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තු සිරකරු සුභසාධන අරමුදල් පනත 4 වන වගන්තිය.	(i) පනත මගින් ප්‍රතිපාදන සලසා ඇති ආදායම් මාර්ග හරහා සිරකරු සුභසාධක අරමුදල වෙත ආදායම් උපයාගැනීමට කඩිනම ක්‍රියාමාර්ග ගැනීම තුළින් අරමුදලේ ඉදිරි පැවැත්ම තහවුරු කිරීමේ

අවශ්‍යතාවය පැවතුණ ද, එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් අරමුදලේ පැවැත්ම සම්බන්ධයෙන් අවිනිශ්චිත තත්ත්වයක් නිරූපණය විය.

(ii) පනත මඟින් ප්‍රතිපාදන සලසා ඇති ආදායම මාර්ග යටතේ ආදායම් එකතු කිරීමේ සැලැස්ම සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගතව නොතිබීම හේතුවෙන් එක් එක් බන්ධනාගාර විසින් ආදායම් ඉපැයීම සඳහා වූ අරමුණු හා ඒවා ළඟාකර ගැනීමට භාවිතා කරනු ලබන උපායමාර්ගික සැලසුම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ I කොටස හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය.

(i) මුදල් රෙගුලාසි 877 (I) (ඇ) ඡේදය

ඉදිරි වර්ෂයේ අයවැය ලේඛනය එම අරමුදලේ අරමුණට අනුකූලව පිළියෙලකර අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කළ යුතු වුවත්, 2025 වර්ෂයේ දී අයවැය ඇස්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම 2025 ජනවාරි 15 වන දින දක්වා ප්‍රමාද වී තිබුණු අතර, අයවැය සඳහා අනුමැතිය 2025 මැයි 15 වන දින දක්වා වූ ප්‍රමාදය හේතුවෙන් 2025 වර්ෂයේ ජූනි මස තෙක් අරමුදලෙන් කිසිදු වියදමක් සිදුව නොතිබුණි.

(ii)	මුදල් රෙගුලාසි 877 (2) (අ) ඡේදය	අරමුදල සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යා යුතු වුවද ඉන් බැහැරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලබැංකු ගිණුම යටතේ අරමුදල ගනුදෙනු ඉටුකර නිබුණි.
(iii)	මුදල් රෙගුලාසි 877 (2) (ඇ) හා මාර්ගෝපදේශ අංක 04	එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි පරිදි ප්‍රධාන කාර්යයන් පිළිබඳ කාර්තුමය වාර්තා එම කාර්තුව අවසන් වී දින 15ට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ)	2024 නොවැම්බර් 01 දිනැති අංක 17/2024 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය.	කෙටිකාලීන හා දීර්ඝකාලීන වැඩසහන ක්‍රමයක් යටතේ රැඳවියන් සේවයේ යෙදවීමෙන් උපයන ආදායමෙන් සියයට 10ක් අරමුදලට ලබා ගැනීමේ හැකියාව නිබුණද ආදායම් උපයාගත හැකි ආයතන හඳුනාගෙන ආදායම් මාර්ග වැඩි කර ගැනීම කෙරෙහි අවධානය අවම මට්ටමක පැවතුණි.

3.2 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.40,926ක ඌණතාවයක් වූ අතර, ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.1,290,052ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,330,978ක අඩුවීමක් නිරීක්ෂණය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායමේ රු.831,006ක අඩුවීමත්, වියදම් රු.499,973ක වැඩිවීමත් හේතුවී නිබුණි.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4.1 අරමුදලේ කාර්ය සාධන දර්ශක - **2025** (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තථ්‍ය නිමැවුම		
	100%- 90%	**75%-89%**	**50%- 74%**
නේවාසිකයින් අධ්‍යාත්මික හා ආගමික වැඩ සටහන් සඳහා යොමු කිරීම වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රතිශතය	105%		
නේවාසිකයින්ගේ අධ්‍යාපන හා සුභසාධන කටයුතු වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රතිශය	95%		
නේවාසිකයින්ගේ ක්‍රීඩානුසලතා වැඩිදියුණු කිරීම හා වෙනත් පහසුකම් ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රතිශතය	90%		
විවිධ කුසලතා සහිත නේවාසිකයින් වෙනුවෙන් ඔවුන්ගේ දක්ෂතා අගයනු වස් තෑගි පිරිනැමීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රතිශතය	94%		
නේවාසිකයින්ගේ පශ්චාත්භාර සේවා කටයුතු වෙනුවෙන් වන ප්‍රතිපාදන උපයෝජනයේ ප්‍රතිශතය	124%		

5.1 ගනුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න. මෙම අරමුදල සඳහා අදාල නොවේ.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	**50%-74%**	**75%- 100%**

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය - මෙය පෘථුවම අදාල නොවන අතර, මෙම අරමුදල සඳහා වෙනම සේවක සංඛ්‍යාවක් නොමැත. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ම මෙහි කටයුතු කරන බැවින් නිලධාරී පුරප්පාඩු නොමැත.

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ			
තෘතීයික			
ද්විතියික			
ප්‍රාථමික			
කොන්ත්‍රාත්/ අනියම්			

06.2 **අරමුදලේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න. - අදාල නොවේ.

06.3 මානව සම්පත් සංවර්ධනය -මෙම අරමුදල සඳහා අදාල නොවේ.

වැඩසටහනේ නම	පුහුණු කරනලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම්/ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		

*ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. - අදාල නොවේ.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.2	පුද්ගල පඩිනාඩි ලේඛන/ පුද්ගල පඩිනාඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.9	භාණ්ඩ පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			

3.1	මූල්‍ය බලනල ආයතනය තුළ බලනල පවරාදී නිසීම	-		
3.2	මූල්‍ය බලනල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර නිබීම	-		
3.3	සෑම ඉනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලනලපවරාදී නිසීම	-		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	-		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	-		
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන නිබීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	-		
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නිබීම.	-		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	-		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	-		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා නිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නිබීම	-		

6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	-		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMAවක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	-		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ වක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම සිළිබඳ නොරතුරු කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	-		
8.2	ඉහත සඳහන් වක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම වක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා සිළිබඳ නොරතුරු කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරනිබීම	-		
8.3	රාජ්‍ය මුදල් වක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සම්ක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
8.4	වාර්ෂික භාණ්ඩ සම්ක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ වක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	-		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	-		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචික වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	-		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	-		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	-		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන වක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	-		

9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන නිබීම.	-		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර නිබීම	-		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අනුරූප බැංකු ගිණුම් නිරවුල් කර නිබීම	-		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර නිබීම	-		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	-		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම.	-		
12.2	හිඟමිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර නිබීම	-		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟමිටි ණය ශේෂ නිරවුල් කර නිබීම	-		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නිබීම.	-		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල්	-		

	පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම			
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ නත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	-		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි නත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	-		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	-		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ 176 අනුව ඕහ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	-		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	-		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරතිබීම	-		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	-		

ඇමුණුම

(74

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනත

[පනතිකය පවරගත් කළේ 1973 මැයි මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1973 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය

ජාතික රාජ්‍ය බැංකුවේ 1973 අංක 18 දරන බැංකුකාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනත

[සභාතිකය සවිගන් කළේ 1973 මැයි මස 9 වන දින]

එල්.ඩී.—ඕ. 2/73.

සිරකරු ශුභ සාධක අරමුදලක් පිහිටුවීම සඳහාත් සිරකරුවන්ගේ පොදු ශුභ සිද්ධිය සඳහා ඒ අරමුදලින් මුදල් වියදම් කිරීම සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බැංකුකාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. පාඨය

2. (1) මේ පනතේ කාර්යයන් සඳහා, (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) බැංකුකාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබේ. බැංකුකාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල පිහිටුවීම.

(2) මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නියම කරනු ලබිය හැකි ආකාරයෙන් අරමුදලේ පොදු ශිෂ්‍යමක් පවත්වාගෙන යා යුතු ය.

3. අරමුදලේ පාලනය සහ කළමනාකරණය බැංකුකාර අකොමසාරිස් වරයා වෙත පැවරෙන්නේ ය. අරමුදලේ පාලන සහ කළමනාකරණ

4. පහත සඳහන් මුදල් අරමුදලේ ශිෂ්‍යමට බැර කළ යුතුය :— අරමුදල බැර කරනු ලබන මුදල්.

(අ) මේ පනත ක්‍රියාත්මක වන දින බැංකුකාර දෙපාර්තමේන්තුවේ ගණුම් පොත්වල දැක්වෙන පරිදි "සිරකරු ශුභ සාධක අරමුදලේ පොදු තැන්පත් මුදල් ශිෂ්‍යමෙහි" බැරට ඇති සියලු මුදල් ;

(ආ) විනෝදාංශ ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන ශුද්ධ ආය මුදලින් ලේකම් විසින් කලින් කල තීරණය කරනු ලබිය හැකි කොටස ;

(ඇ) සිරකරුවන්ගේ වැටුප්වලින් කරා ගන්නා අනිවාර්ය අය කිරීම් ;

(ඈ) සිරකරුවන්ගේ ශුභ සාධනය සඳහා මහජනයා විසින් කරනු ලබන යම් පරිත්‍යාග ;

(ඉ) බැංකුකාර කම්කරුවන්ගේ සේවය ඇපයීම සඳහා අය කිරීම් වශයෙන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින් සහ වෙනත් ආයතනවලින් අයකර ගනු ලබන මුදල් කිසිවක් ;

(ඊ) බලය නොලබා සිරකරුවන්ගේ සන්නිධායනි නාමගෙන තිබී, පොයගන්නා ලද යම් මුදල් ;

(උ) බැංකුකාර ස්ථානයෙහි [illegible] අධිනීය ඔප්පු කොට වූ යම් මුදල් ;

—කෙ 2103/—2.057 (73/3)

2 ජාතික රාජ්‍ය බැංකුවේ 1973 අංක 15 දරන බැංකුකරු දෙපාර්තමේන්තුවේ පිරිසැරු ශුභ සාධක අරමුදල් පනත

(උප) (i) බැංකුකරු දෙපාර්තමේන්තුව විසින් [illegible] යනු ලබන වතුකුම්ම කොමසරයෙන්,

(ii) පිරිසැරුවන් විසින් සැදෙන ලද විනෝදාංශ [illegible] භාර කිරීමෙන්, සහ

(iii) බැංකුකාරයාගේ සවත්මාණෙහි යනු [illegible] ලබන ලාභාංශවලින්

ලැබෙන මුද්ධ ලාභ; සහ

(ඇ) මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන වෙනත් ආයෝජ මුදල්.

අරමුදල් මුදල් වියදම් කිරීම. 5. අරමුදලේ බැරට ඇති මුදල්, ලේකම් විසින් කලින් කල් නියුක්ත් කරනු ලබන උපදෙස්වලට යටත්ව පහත සඳහන් කාර්ය සාධනය සඳහා වියදම් කිරීමට බැංකුකාර කොමසරිස් වරයාට බලය ඇත්තේ ය:—

(අ) පිරිසැරුවන්ගේ අධ්‍යාත්මික සහ ආගමික යුතු සිද්ධිය;

(ආ) පිරිසැරුවන්ගේ අධ්‍යාපනික යුතු සිද්ධිය;

(ඇ) පිරිසැරුවන් සඳහා විනෝද ක්‍රීඩා පහසුකම් සහ වෙනත් සුව පහසුකම් සැලැස්වීම;

(ඈ) පිරිසැරුවන්ට තැගි දීම;

(ඉ) ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ පිරිසැරුවන් සඳහා ආපනශාලා පවත්වාගෙන යාම පිණිස, ආපසු ගෙවිය නැති අත්තිකාරම් ගෙවීම.

(උප) →

මුල් වර්ෂය. 6. අරමුදලේ කාර්යයන් සඳහා වූ මුදල් වර්ෂය ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ ව දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන මාර්ගය වන්නේ ය.

ගණන් බැලීම සහ විගණනය. 7. (1) අරමුදලේ ගණන් විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතු ය.

(2) එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු හැකි තාක් ඉක්මණින් අරමුදලේ කටයුතු පිළිබඳ වූ ආකෘරය දක්වන්නා වූ ද අරමුදලේ කටයුතුවලට සම්බන්ධ සියලු කරුණු පිළිබඳ පූර්ණ විස්තර අඩංගු වූ ද පූර්ණ ප්‍රකාශයක් බැංකුකාර කොමසරිස්වරයා විසින්, විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක් ද සමඟ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. අමාත්‍යවරයා විසින් හැකි පමණ ඉක්මණින් එහි වාර්තාව ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

අර්ථ විග්‍රහය. 8. මේ පනතෙහි "ලේකම්" යන්නෙන් බැංකුකාර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් අදහස් වේ.



ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1979 අංක 54 දරන
බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් (සංශෝධන) පනත

[සභාගතිකය සභාගත් කළේ 1979 අගෝස්තු මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරනු ලදී.

1979 සැප්තැම්බර් 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිවිශේෂයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරනු ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගැනීමට හැක

මිල : රුපියල් 20 ශ

තැපැල් ගාස්තුව : රුපියල් 25 ශ

1979 අංක 54 දරන ඖද්‍යෝගාරක දෙපාර්තමේන්තුවේ සිරකරු ඇඟ සාධක අරමුදල් (සංශෝධන) පනත

[සභාවීයය සංසහාන් කෙළේ 1979 ඔක්තෝබර් මස 30 වන දින.]

එල්. ඩී.—ඛ. 79/75.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන ඖද්‍යෝගාරක දෙපාර්තමේන්තුවේ සිරකරු ඇඟ සාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත 1979 අංක 54 දරන ඖද්‍යෝගාරක දෙපාර්තමේන්තුවේ සිරකරු ඇඟ සාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන ඖද්‍යෝගාරක දෙපාර්තමේන්තුවේ සිරකරු ඇඟ සාධක අරමුදල් පනතෙහි 4 වන වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(අඅ) සිරකරුවන්ගේ වේතන සහ පුද්ගලික මුදල් ඔහුම වූ පොදු තැන්පතුවෙහි යම් සිරකරුවකුගේ බැරව ඇත්තා වූ මුදල්වලින්, ඒ සිරකරු මුදා හරිනු ලැබූ දිනයේ සිට වර්ෂයකට නොඅඩු කාලයක් තුළ ගිමිකම් පාතු නොලැබ සිටෙන්නා වූ යම් මුදලක් ;".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(i) එම වගන්තිය අවකාශයේ ඇති කැවතීමේ ලකුණ වෙනුවට තිත් කොමාවක් ආදේශ කිරීමෙන් ; සහ

(ii) එම වගන්තිය අගට පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඊ) සිරකරුවන් ඖද්‍යෝගාරයෙන් නිදහස් කරනු ලැබීමෙන් පසුව ඔවුන්ගේ පුනරුත්ථාපනයෙහි ලා උපකාරී වන පරිදි භාර දේවා.".

ඒ 12811—11,600 (79/07)